# 8 මහනුවර රාජධානිය

## හැඳින්වීම

කෝට්ටේ හා සීතාවක රාජධානියේ බිඳ වැටීමෙන් පසු රටේ ස්වාධීනත්වය රැකීම මහනුවර රාජධානියේ වගකීමක් බවට පත් විය. මෙරට පැවති වෙනත් කිසිම රාජධානියක් මුහුණ නොදුන් අභියෝග රැසකට මුහුණ දෙමින් එම රාජධානියේ රජවරු හා මහජනතාව තමන් වෙත පැවරුණු වගකීම වර්ෂ 1815 වන තෙක් නොපිරිහෙලා ඉටු කළහ. ලංකාවේ අවසන් රාජධානිය වූ මහනුවර රාජධානියේ ආරම්භය, ව්‍යාප්තිය, පරිපාලන සංවිධානය සහ සමාජ ආර්ථික රටාව පිළිබඳ තොරතුරු මෙම ඒකකය තුළින් ඔබට අධ්‍යයනය කිරීමට සැලසේ.

### 8.1 ආරම්භය හා ව්‍යාප්තිය

සෙංකඩගල නුවර, උඩරට රාජධානිය, කන්දෙ නුවර ආදී විවිධ නම්වලින් මහනුවර රාජධානිය හඳුන්වා තිබේ.

කන්ද උඩරට රාජධානියේ අගනුවර වූයේ මහනුවර යි. එය ස්වාභාවිකව ආරක්ෂිත වූ ස්ථානයකි. මහනුවර නගරයට මහවැලි ගඟෙන් ආරක්ෂාවක් ලැබේ. බලන, හුන්නස්ගිරිය, වැනි දුර්ග මාර්ග නිසා පහසුවෙන් මෙම ප්‍රදේශයට ඇතුළු වීම දුෂ්කර වේ. එසේ ම මහනුවර රාජධානිය සෞම්‍ය දේශගුණයකින් හා සරුසාර භූමි භාගයකින් සමන්විත ය.


හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ කෝට්ටේ රාජ්‍යයට යටත් ප්‍රාදේශීය පාලන ඒකකයක් වශයෙන් පැවති උඩරට ප්‍රදේශ ආශ්‍රිතව මුල් වරට ස්වාධීන රාජධානියක් ගොඩනගන ලද්දේ සේනා සම්මත වික්‍රමබාහු රජතුමා විසිනි. මේ නිසා උඩරට රාජධානියේ ආරම්භකයා සේනා සම්මත වික්‍රමබාහු රජු ලෙස සැලකේ.

සේනා සම්මත වික්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තකයා වූයේ ඔහුගේ පුත් ජයවීර බණ්ඩාරය. (15111551) මෙතුමා දිගු කලක් උඩරට පාලනය කළේය. මොහු සීතාවක පාලක මායාදුන්නේ රජුගේ මිතුරෙකු විය. කෝට්ටේ පාලක VI වන විජයබාහු රජුට විරුද්ධව විජයබා කොල්ලය ඇති වූ සමයේ දී ජයවීර බණ්ඩාර රජු මායාදුන්නේට ආධාර සපයා තිබේ.

ජයවීර බණ්ඩාර රජුගේ ඇවෑමෙන් ඔහුගේ පුත් කරලියැද්දේ බණ්ඩාර උඩරට රජ බවට පත් විය. මෙතුමා පෘතුගීසීන් හා හිතවත් ප්‍රතිපත්තියක් ගෙන ගියේය. කරලියැද්දේ බණ්ඩාරගේ මෙම ප්‍රතිපත්තිය කෙරෙහි උඩරට රදල ප්‍රධානිහු අමනාප වූහ. එනිසා ඔවුහු සීතාවක පාලක රාජසිංහ රජුට සහාය දුන්හ. එකළ උඩරට ප්‍රභූවරයෙකු වූ පේරාදෙණියේ වීරසුන්දර බණ්ඩාර පළමුවන රාජසිංහ රජුට උඩරට ආක්‍රමණය කිරීමට උපකාර කළේය. මෙම ආක්‍රමණයට මුහුණ දී ගත නොහැකි වූ කරලියැද්දේ බණ්ඩාර තම දියණිය වූ කුසුමාසන දේවිය හා බෑනා වූ යමසිංහ බණ්ඩාර සමඟ පෘතුගීසීන් වෙත පලා ගියේය. කුසුමාසන දේවිය දෝන කතිරිනා නමින් ද යමසිංහ බණ්ඩාර දෙන් පිලිප් නමින්ද පෘතුගීසීන් වෙතින් බෞතීස්මය වූහ.

ක්‍රි.ව. 1580 දී පමණ උඩරට යටත් කොටගත් පළමුවන රාජසිංහ රජු සීතාවක සිට උඩරට ප්‍රදේශ පාලනය කළේය. එහෙත් වීරසුන්දර බණ්ඩාරගේ ක්‍රියාකලාපය කෙරෙහි සැක සිතූ පළමුවන රාජසිංහ රජු උපායශීලීව ඔහු මරණයට පත් කළේය. මෙම සිදුවීමෙන් පසු වීරසුන්දර බණ්ඩාරගේ පුතා වූ කොනප්පු බණ්ඩාර ද පෘතුගීසීන් වෙත පලාගොස් අවුස්ත්‍රියාවේ දෙන් ජුවාන් නමින් බෞතීස්ම ලැබීය.

සීතාවක රාජසිංහ රජු උඩරට කෙරේ අනුගමනය කළ ඇතැම් ප්‍රතිපත්ති ගැන උඩරට ප්‍රභූ පිරිස තුළ කළ කිරීමක් තිබුණි. මේ නිසා අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් පෘතුගීසීහූ තමන් භාරයේ සිටි යමසිංහ බණ්ඩාර උඩරටට යවා උඩරට ඇතැම් ප්‍රභූවරුන්ගේ ද සහායෙන් එහි පෘතුගීසි ගැති පාලනයක් පිහිට වූහ. පෘතුගීසීන් යමසිංහ බණ්ඩාර උඩරටට යැවූ අවස්ථාවේ ඔහුගේ ආරක්ෂාවට යැවූ හමුදාවත් සමඟ වීරසුන්දර බණ්ඩාගේ පුත් කොනප්පු බණ්ඩාර ද උඩරටට පිටත් කළේය. පෘතුගීසීන්ගේ රූකඩ පාලකයා වූ යමසිංහ බණ්ඩාර කෙටි කාලයකින් මිය ගිය හෙයින් ඔහුගේ ලාබාල පුත් කුමරා සිංහාසනයට පත් කොට පාලනය ගෙන යාමට පෘතුගීසීන් උත්සාහ කළ නමුත් කොනප්පු බණ්ඩාර නිසා එය




සැලසුම අංක 8.1 පැරණි මහනුවර නගරයේ සැලැස්ම දැක්වෙන සිතියමක්. T- දළදා මාලිගය A- මඟුල් මඩුව N- නාථ දේවාලය P- පත්තිනි දේවාලය V- විෂ්ණු දේවාලය K- කතරගම දේවාලය AV- අස්ගිරි විහාරය AW- අධිකාරම් වලව්ව MV- මල්වත්ත විහාරය S- ස්තූපය B- බෝධීන්වහන්සේ KV- කුමාරුප්පේ වීදිය BR- රජුගේ හමුදා සේනාංක නිවස්න KP- රජ මාලිගය

අසාර්ථක විය. උඩරැටියන්ගේ සහාය ලබා ගත් කොනප්පු බණ්ඩාර පෘතුගීසීන්ට එරෙහිව උඩරට බලය අල්ලාගෙන පළමුවන විමලධර්මසූරිය නමින් රජකමට පත් විය. කොනප්පු බණ්ඩාරගේ මෙම නිර්භීත ක්‍රියාකාලාපය නිසා උඩරට රාජධානිය තුළ පෘතුගීසි පාලනයක් ඇති වීම වැළකුණි.

### පළමුවන විමලධර්මසූරිය රජු (1592-1604)

යමසිංහ බණ්ඩාරගෙන් පසු උඩරට රජ බවට පත් පළමුවන විමලධර්මසූරිය රජු වීරසුන්දර බණ්ඩාරගේ පුතා විය. මෙතුමා උඩරට නව රාජවංශයක ආරම්භකයා වේ. පළමුවන විමලධර්මසූරිය රජු බලයට පත් වීමත් සමඟ මුහුණ දුන් අභියෝග කිහිපයක් විය.

1. නීත්‍යානුකූල රාජ්‍ය උරුමයක් නොවීම
2. උඩරට රාජධානිය පෘතුගීසි ග්‍රහණයෙන් බේරා ගත යුතු වීම
3. උඩරට රාජ්‍ය සීතාවක බලපෑමෙන් මුදගත යුතු වීම
4. පරිහානියට පත් බුදු සසුන නගා සිටු විය යුතු වීම.
5. මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණු කළ යුතු වීම

- **විමලධර්මසූරිය රජු උඩරට සිය නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීට පියවර කීපයක් අනුගමනය කළේය.**

1. උඩරට රාජධානියේ නීත්‍යානුකූල උරුමය හිමි වූ කුසුමාසන දේවිය විවාහ කොට ගෙන රාජ්‍යත්වය



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

තහවුරු කර ගැනීම
2. රෝමානු කතෝලික ආගම අතහැර බුදු දහම වැළඳ ගැනීම
3. විමලධර්මසූරිය නමින් බෞද්ධ නමක් ලබා ගැනීම
4. දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතුව මහනුවරට වැඩම කරවීම

- **සීතාවක රාජධානියේ බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම පිණිස උඩරටියන්ගේ සහයෝගයෙන් පළමුවන රාජසිංහ රජු පරාජයට පත් කෙරින.**
- **මෙතුමා උඩරට රාජ්‍ය පෘතුගීසි ග්‍රහණයෙන් බේරා ගැනීමට අනුගමනය කළ පියවර කිහිපයකි.**

1. ක්‍රි.ව.1594 දන්තුරේ සටනේ දී පෘතුගීසීන් අන්ත පරාජයට පත් කිරීම
2. පෘතුගීසීන්ට එරෙහිව පහතරට ඇති වන කැරලිවලට සහය දීම
3. පෘතුගීසින් පලවාහැරීමට ලන්දේසි සහය ලබා ගැනීමට උත්සාහ කිරීම

- **පරිහානියට පත් බුදුදහම නගා සිටු වීමට විමලධර්මසූරිය රජු අනුගමනය කළ පියවර කිහිපයකි.**

1. බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම

2. ලංකාතිලකය, රිදී විහාරය, ගඩලාදෙණිය, වැනි පැරණි වෙහෙර විහාර අළුත්වැඩියා කිරීම

- **මෙතුමා මහනුවර රාජධානියේ ආර්ථික දියුණුව පිණිස අනුගමනය කළ පියවර කිහිපයකි.**

1. ගොවිතැන දියුණු කිරීමට කටයුතු කිරීම

2. කපු වගාව දියුණු කිරිමට අනුබල දීම

3. කොත්මලේ හා වලපනේ ප්‍රදේශයේ යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම

4. උඩරට රාජ්‍ය ආශ්‍රිත වෙඩි ලුණු කර්මාන්තයේ දියුණුවට පියවර ගැනීම

මෙසේ විවිධ මාර්ගයන්ගෙන් උඩරට රාජධානිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ පළමුවන



*ඡායාරූපය අංක 8.1 දෙවන රාජසිංහ රජතුමාගේ ස්වරූපය දැක්වෙන සිතුවමකි. මෙය මහනුවර යුගයේ දී මෙහි වාසය කළ රොබර්ට් නොක්ස් නමැති බ්‍රිතාන්‍ය ජාතිකයා විසින් අඳින ලද්දකි.*

විමලධර්මසූරිය රජු හදිසියේ වැළඳුණු දරුණු උණ රෝගයකින් ක්‍රිස්තු වර්ෂ 1604 දී මරණයට පත් විය.

## සෙනරත් රජතුමා (ක්‍රි.ව. 1604-1635)

පළමුවන විමලධර්මසූරිය රජු මිය යන විට ඔහුගේ පුත් කුමාරවරු ලාබාල වියේ පසුවූහ. එනිසා විමලධර්මසූරිය රජුගේ ඥාති සහෝදර සෙනරත් කුමරු 1604 දී උඩරට රජකමට පත් විය. මෙතුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග කිහිපයක් විය.

1. උඩරට රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම

2. පෘතුගීසීන්ගෙන් උඩරට රාජ්‍යයට එල්ල වූ තර්ජන අවම කර ගැනීම

සෙනරත් රජු බලයට පත් මුල් අවධියේ දී කුසුමාසන දේවිය (දෝන කතිරිනා) විවාහ කොට ගෙන රාජ්‍යත්වය තහවුරු කර ගත්තේය.

කුසුමාසන දේවිය පළමුවන විමලධර්මසූරිය රජුගෙන් පුතුන් දෙදෙනෙකුද සෙනරත් රජුගෙන් එක් පුතෙකුද ලැබුවාය. මොවුන් අතුරින් වඩා දක්ෂ වූයේ බාල පුත් මහා අස්ථාන කුමරුය (දෙවන රාජසිංහ කුමරු). රජකම උදෙසා කුමාරවරු අතර ඇති වන තරගය වැළැක්වීමට සෙනරත් රජු උඩරට රාජ්‍යය කොටස් තුනකට බෙදා එම ප්‍රදේශ කුමාරවරුන්ට පවරා දී ඇත. ඒ අනුව ඌව ප්‍රදේශය කුමාරසිංහ කුමරුට ද, මාතලේ ප්‍රදේශය විජේපාල කුමරුට ද, මහනුවර ප්‍රදේශය රාජසිංහ කුමරුටද පැවරිණි.

මහා අස්ථාන කුමරු හෙවත් දෙවන රාජසිංහ කුමරු ළාබාල වියේ සිටම උඩරට රාජ්‍යය පෘතුගීසි තර්ජනවලින් බේරා ගැනීමට පියාට සහය විය. රණශූරත්වයෙන් පෙරමුණේ සිටි හෙතෙම ක්‍රිස්තු වර්ෂ 1630 ඌව රන්දෙණිවෙල සටනේ දී පෘතුගීසීන් සමූල ඝාතනය කළේය. එසේම උඩරට දේශසීමාවේ වූ පෘතුගීසීන්ට යටත් ගම්වලට ප්‍රහාර එල්ල කර ඔවුන් අඩපණ කිරීමටද ක්‍රියා කළේය.

## දෙවන රාජසිංහ රජු ( ක්‍රි.ව.1635 - 1687)

ක්‍රි.ව 1635 දී සෙනරත් රජු මිය යාමත් සමඟ රාජසිංහ කුමරු දෙවන රාජසිංහ නමින් උඩරට රජ බවට පත් විය. මෙතුමා සිය පාලන සමයේ දී මුහුණ දුන් අභියෝග කිහිපයකි.

1. පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ල වන ප්‍රහාර මැඩ පැවැත්වීම

2. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම

3. උඩරට රදල ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම

4. ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම

පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ල වන ප්‍රහාර මැඩ පැවැත්වීම සඳහා මෙතුමා සිය පියාගේ රාජ්‍ය සමයේ සිට ම කටයුතු කළේය. ඌව රන්දෙණිවල සටනේ මෙන් ම වර්ෂ 1638 ගන්නෝරු සටනේ දී ද හෙතෙම පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළේය.

පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට නාවුක බලය සහිත කණ්ඩායමක සහය රජුට අවශ්‍ය විය. ඒ සඳහා ලන්දේසි සහය ලබා ගැනීමට දෙවන රාජසිංහ රජු කටයුතු කළේය. ක්‍රිස්තු වර්ෂ 1638 දී ලන්දේසි සහය ලබා ගෙන වර්ෂ 1658 වන විට පෘතුගීසීන් මෙරටින් නෙරපා හැරීමට දෙවන රාජසිංහ රජු සමත් විය. පෘතුගීසීන් මෙරටින් පලවා හැරිය ද රජු බලාපොරොත්තු නොවූ අයුරින් ලන්දේසීහු පෘතුගීසින් බල ප්‍රදේශයන් හි සිය බලය පිහිටු විය. මුහුදු බඩ ප්‍රදේශ රැසක බලය පිහිටුවා ගත් ලන්දේසීහු වර්ෂ 1658 සිට තම බල ප්‍රදේශය ව්‍යාප්ත කර ගැනීමට නිරන්තරව උත්සාහ කළහ. වර්ෂ 16651668 කාලයේ දී ලන්දේසීන් විසින් උඩරට ප්‍රදේශ කිහිපයක් අල්ලා ගන්නා ලදී. එම කාලයේ දී නිහඬව සිටි දෙවන රාජසිංහ රජු 1670 1675 කාලයේ දී ලන්දේසීන්ට එරෙහිව ප්‍රබල ප්‍රහාර කිහිපයක් දියත් කොට ඔවුන් සතු වූ ප්‍රදේශ රැසක් ම අත්පත් කර ගත්තේය. මේ නිසා උඩරට රාජධානියේ ශක්තිය තේරුම් ගත් ලන්දේසීහු එතැන් සිට උඩරට රජවරුන් සමඟ සාමකාමීව සිටීමට වගබලා ගත්හ.

ලන්දේසීන් මෙරට වෙරළබඩ ප්‍රදේශයේ බලය පිහිටුවා ගැනීම දෙවන රාජසිංහ රජුගේ මුළු රටෙහිම රජ බවට පත් වීමේ අරමුණට බාධාවක් විය. එහෙත් පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමේ දී ඔවුන් සතු වූ ප්‍රදේශයන්ගෙන් වැඩි කොටසක් උඩරට රාජ්‍ය සතු කර ගැනීමට මෙතුමා සමත් විය. කල්පිටිය, හලාවත, ත්‍රිකුණාමලය හා මඩකලපුව වැනි වරායන් මෙකල උඩරටට අයත් විය.

මෙසේ උඩරට රාජධානියේ බල ව්‍යාප්තියට විශාල සේවයක් සිදු කළ දෙවන රාජසිංහ රජු වසර 50 කට වැඩි කාලයක් රජකම දරා වර්ෂ 1687 දී මරණයට පත් විය.

## දෙවන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව.1687- 1707)

දෙවන රාජසිංහ රජුගේ ඇවෑමෙන් ඔහු පුත් දෙවන විමලධර්මසූරිය රජ බවට පත් විය. මෙතුමා පියා මෙන් දක්ෂයෙක් නොවීය. එනිසා මෙම රජුගේ කාලයේ දී උඩරට රදල ප්‍රධානීන් සිය බලය වර්ධනය කරගනු දක්නට ලැබේ.

මෙතුමා රජ බවට පත් වීමෙන් පසු



*ඡායාරූපය අංක 8.2 දහනමවන සියවසේ දී මහනුවර දළඳ පෙරහැර සහ මහනුවර නගරයේ වීදිවල ස්වරූපය පෙන්වන දුර්ලභ ගනයේ ඡායාරූපයක්*

ලන්දේසීන් සමඟ සාමකාමීව කටයුතු කිරීමට ක්‍රියා කළේය. දක්ෂ පාලකයෙකු නොවුව ද සිය පියාගේ සමයේ මහනුවර රාජධානියේ බලය ව්‍යාප්තව තිබූ ප්‍රදේශය රැක ගැනීමට මෙතුමා සමත් විය.

දෙවන විමලධර්මසූරිය රජුගේ කාලය වන විට උඩරට රාජධානියේ උපසම්පදාව නැවතත් පරිහානියට පත්ව තිබුණි. එනිසා නැවත බුරුම දේශයෙන් මෙරටට උපසම්පදාව ගෙන ඒමට මෙතුමා පියවර ගෙන ඇත. ඒ සඳහා ඔහුට ලන්දේසීන් උපකාර කළ බවට තොරතුරු තිබේ. මෙතුමා දළදා මාලිගාව ප්‍රතිසංස්කරණය කළ බවද දක්වේ. ක්‍රිස්තු වර්ෂ 1707 දී දෙවන විමලධර්මසූරිය රජු මරණයට පත් විය.

### ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ක්‍රි.ව.1707-1739)

දෙවන විමලධර්මසූරිය රජුගේ පුත් ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ 1707 දී උඩරට රජ බවට පත් විය. මෙතුමාට පරිපාලන කටයුතු පිළිබඳව මනා අවබෝධයක් නොවීම දුර්වලතාවක් විය. මෙහි ප්‍රතිඵලය වූයේ උඩරට ප්‍රභූ පිරිස් තව දුරටත් සිය බලය වර්ධනය කර ගැනීම යි.

මෙතුමා ද සිය පියා මෙන් දකුණු ඉන්දියානු කුමාරිකාවක් සරණ පාවා ගත්තේය. මෙම විවාහයෙන් රජුට දරුවන් නොවීය. එහි ප්‍රතිඵලය වූයේ දකුණු ඉන්දියානු සම්ප්‍රදායට අනුව යමින් බිසවගේ සහෝදරයාට රජකම උරුම වීම යි.

## නායක්කර් රාජ වංශය

### ශ්‍රී විජය රාජසිංහ රජු (ක්‍රි.ව 1739 - 1747)

ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු උරුමකරුවෙකු නොතබා ම වර්ෂ 1739 දී මිය ගියේය. එහිදී දකුණු ඉන්දියානු සම්ප්‍රදායට අනුව බිසවගේ සහෝදරයා වූ ශ්‍රී විජය රාජසිංහ කුමරු මහනුවර රාජධානියේ රජකමට පත් විය. මෙතුමාගෙන් ඇරඹි නව රාජ වංශය නායක්කර් වංශය යනුවෙන්

හඳුන්වනු ලැබේ. ශ්‍රී විජය රාජසිංහ රජු මුහුණ දුන් ප්‍රධාන අභියෝගය වූයේ උඩරට රාජ සභාවේ රදළ ප්‍රධානීන්ගේ බලය වර්ධනය වී තිබීම ය. මෙම තත්ත්වය සමනය කර ගැනීම සඳහා ඔහු නායක්කර් පරම්පරාවේ ඥාතීන්ට උඩරට රාජ සභාවේ තනතුරු ලබා දුණි.

බුදු දහම වැළඳ ගෙන දිගු කලක් භික්ෂූන් ඇසුරේ හැදී වැඩුණු මෙතුමා වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි බුරුමයෙන් උපසම්පදාව මෙරටට ගෙන ඒමට කටයුතු කළත් එම ව්‍යායාමය සාර්ථක නොවී ය.

ශ්‍රී විජය රාජසිංහ රජු දකුණු ඉන්දියානු කුමාරියක් සරණ පාවා ගත් නමුත් දරුවන් නොසිටි බැවින් රාජ්‍ය උරුමකරුවකු නොතබා ම වර්ෂ 1747 දී මිය ගියේය.

**කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව. 1747-1781)**

ශ්‍රී විජය රාජසිංහ රජුගේ මරණයෙන් පසුව එතුමාගේ බිසවගේ සොහොයුරු වූ කීර්ති ශ්‍රී රාජසිංහ වර්ෂ 1747 දී උඩරට රාජධානියේ රජු බවට පත් විය. බලයට පත් වන විට කීර්ති ශ්‍රී රාජසිංහ රජු වයස අවුරුදු 16 තරම් ළාබාල වියේ පසු වූ නිසා එතුමාගේ පියා වූ නරේනප්පා නායක්කර් පාලන කටයුතුවලට ඇඟිලි ගැසූ බව වාර්තා වේ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු බලයට පැමිණි කාලය වන විට මෙරට බුද්ධ ශාසනය බෙහෙවින් පරිහානියට පත්ව තිබුණි. මේ නිසා වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි රට පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමට මේ රජු ක්‍රියා කළේය. ඒ සඳහා රජු අනුගමනය කළ පියවර කිහිපයක් පහත දැක්වේ.

- රජු සියම් දේශයට දූතයන් යවා උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් මෙරටට වැඩමවා වර්ෂ 1753 දී යළි උපසම්පදාව පිහිටු වීම. එමගින් වර්තමාන සියම් නිකායේ ආරම්භය සිදු විය
- උඩරට හා පහත රට ප්‍රදේශවල පැවැති විහාරාරාම ප්‍රතිසංස්කරණය කරවීම
- වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර පිරිනමා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමට රජු එම හිමියන්ට සහය ලබා දීම
- වර්ෂ 1760 1765 කාලයේ උඩරට හා ලන්දේසීන් අතර යහපත් සබඳතා බිඳ වැටුණි. මේ නිසා දෙපක්ෂය අතර සටන් කිහිපයක් ඇති විය. එම ගැටුම් නිම වූයේ වර්ෂ 1766 දී රජතුමා හා ලන්දේසීන් අතර සාම ගිවිසුමක් අත්සන් කිරීමෙනි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද උඩරට සිංහාසනයට උරුමකරුවෙකු නොතබා වර්ෂ 1781 දී මිය ගියේය.

**රාජාධිරාජසිංහ රජු (ක්‍රි.ව.1781 - 1798)**

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු ඔහුගේ සහෝදරයා රාජාධිරාජසිංහ නමින් උඩරට රජ බවට පත්විය. මේ වන විට උඩරට රදළ ප්‍රභූවරුන් හා නායක්කර් වංශික රජවරුන් අතර වූ මත භේද වර්ධනය වෙමින් තිබුණි.

මෙම රාජ්‍ය සමයේ දී සිදු වූ වැදගත් සිදු වීමක් වූයේ ක්‍රිස්තු වර්ෂ 1796 දී ඉංග්‍රීසීන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගැනීමයි. රාජාධිරාජසිංහ රජු ද අනුප්‍රාප්තිකයෙකු නොතබා ම වර්ෂ 1798 දී මිය ගියේය.

**ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ක්‍රි.ව.1798-1815)**

රාජාධිරාජසිංහ රජුගේ අභාවයෙන් පසුව එවකට මහ අදිකාරම් පිළිමතලව්වේගේ අවශ්‍යතාව පරිදි කන්නසාමි කුමරා ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් වර්ෂ 1798 දී රජකමට පත් කෙරුණි. මෙම රජු ක්‍රමයෙන් තම නායක්කර් ඥාතීන්ගේ බසට අවනත වීම නිසා උඩරට රදළ පිරිස් හා රජු අතර සබඳතාව බිඳ වැටුණි. වර්ෂ 1803 දී ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කළ නමුත් උඩරටියන්ගේ සහායෙන් ඉංග්‍රීසි හමුදාව පරාජය කිරීමට රජු සමත් විය. එහෙත් මෙම රජුගේ පාලන කාලයේ අවසන් වසර කිහිපයේ රජු ඉතා කෲර අන්දමින් කටයුතු කිරීම නිසා මහජනතාව හා රජු අතර සබඳතාව පිරිහුණි. මේ නිසා උපායශීලීව කටයුතු කළ ඉංග්‍රීසීහු 1815 පෙබරවාරි මාසයේ දී උඩරට රාජධානියට හමුදාව යවා රජු අත්අඩංගුවට ගත්හ. 1815 මාර්තු දෙවන දින උඩරට රදලයන් හා ඉංග්‍රීසීන් අතර ඇති වූ උඩරට ගිවිසුම පරිදි එම රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් විය. ඉංග්‍රීසි අත්අඩංගුවේ සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඔවුන් විසින් වෙල්ලෝරයට පිටුවහල් කරන ලදී.

**8.2 මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය**

මහනුවර රාජධානියේ පරිපාලන තන්ත්‍රයේ ඉහළම පුද්ගලයා වූයේ රජතුමා ය. රජතුමාගේ

සභායට අධිකාරම්වරු දෙදෙනෙකු සිටි අතර දේශපාලන වශයෙන් ඔවුන් දෙවැනි වූයේ රජතුමාට පමණි. රාජ්‍යයේ වැදගත් කටයුතු සාකච්ඡා කිරීමට රාජ සභාවක් පැවතුණි. රජුගේ ප්‍රධානත්වයෙන් රැස් වූ මෙම සභාවට අධිකාරම්වරු, දිසාවේවරු, මහ ලේකම්, ඒ ඒ බද්දෙ ලේකම්ලා සහභාගි වූහ. රාජධානියේ පරිපාලන කටයුතු අංශ කිහිපයකට බෙදා තිබුණි. රජුගේ ඍජු පාලනය යටතේ පැවති මහ වාසල සේවය, රජුගේ අධීක්ෂණයෙන් ප්‍රධාන අධිකාරම්වරු හරහා ක්‍රියාත්මක වූ රටවසම නම් ප්‍රදේශීය පාලන සංවිධානය, මහබද්ද හෙවත් ඒ ඒ අංශ ප්‍රධානීන් යටතේ පැවති බද්දෙ සංවිධානය හා විහාර දේවාලගම් පාලනය ප්‍රධාන පරිපාලන අංශ විය.

### රජුගේ බලය

- රටේ ඉහළ ම බලය හිමි තැනැත්තා රජතුමා ය.
- රටේ සාමය පවත්වාගෙන යෑම හා ආරක්ෂාව සැලසීම රජුගේ ප්‍රධාන කාර්යයන් වේ.
- සම්ප්‍රදය හා පෙර සිරිතට අනුව රජු කටයුතු කළ යුතු විය.
- රටේ ඉහළම අධිකරණය රජු වූ අතර වැරදිකරුවෙකුට මරණීය දණ්ඩනය පැනවීමේ බලය රජුට තිබුණි.
- රටේ සියලු දේශපාලන කටයුතු, ආර්ථික කටයුතු හා පරිපාලන කටයුතු රජුගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක විය.
  **අදිකාරම්වරු**
  පහත සඳහන් ප්‍රදේශ ඒ ඒ අධිකාරම්වරයා යටතේ පරිපාලනය විය.

| මහ අදිකාරම් | දෙවන අදිකාරම් |
|---|---|
| හත් කෝරලේ | හතර කෝරලය |
| ඌව | තුන් කෝරලය |
| මාතලේ | සබරගමුව |
| වලපනේ | ඌව පළාත |
| බින්තැන්න | උඩු නුවර, යටි නුවර, තුම්පනේ |
| වෙල්ලස්ස | කොත්මලේ, බුලත්ගම |
| නුවරකලාවිය | |

මහ අදිකාරම් හා දෙවන අධිකාරම් ලෙස හැඳින් වූ අදිකාරම් තනතුරු දෙකක් පැවතුණි. මහ අදිකාරම් පල්ලෙගම්පහ අදිකාරම් ලෙසත්, දෙවන අදිකාරම් උඩගම්පහ අදිකාරම් ලෙසත් හැඳින්විණ.

අදිකාරම්වරුන්ගේ ආඥා හෝ පණිවිඩය ප්‍රාදේශීය නිලධාරීන් කරා ගෙන ගිය පිරිස කටුපුල්ලේ පණිවිඩ කරුවන් ලෙස හැඳින්විණ. රිදී විල්ලක් දැමූ ඉහළ කොන නැමූ වේවැලක් ඔවුන්ගේ නිල සලකුණ විය.

### මහවාසල හෙවත් මාලිගාව සතු නිලධාරීන්

රජ තනතුරේ ගාම්භීරත්වය රැකගෙන රජවාසල කටයුතු පවත්වාගෙන යාම මේ නිලධාරීන්ට භාර විය. රජවාසල පිරිස්වලට ආහාර පාන සැකසීම, රජවාසලට රෙදි පිළි, ආභරණ ගෘහ භාණ්ඩ සැපයීම ආදියත් මොවුන්ට අයත් රාජකාරි විය. රජුගේ ඍජු අධීක්ෂණය යටතේ මෙම පිරිස පාලනය කෙරිණි. මහ වාසල ඒ ඒ කාර්යාංශ භාරව නිලමෙවරු හා මුහන්දිරම්වරු විශාල පිරිසක් රාජකාරී කටයුතුවල නිරතව ඇත. ගජනායක නිලමේ හෙවත් ඇතුන්ගේ කටයුතු භාර තැනැත්තා, මහලේකම්, මහ ගබඩා නිලමෙ, දියවඩන නිලමෙ, හළු වඩන නිලමෙ, බත් වඩන නිලමෙ, අස් පන්තියෙ මුහන්දිරම් “ කවිකාර මඩුවෙ මුහන්දිරම් වැනි අය මහවාසල නිලධාරීන්ට උදහරණ වේ.

### රටවසම හෙවත් ප්‍රදේශ පාලනය

උඩරට රාජ්‍ය රට හා දිසාව යනුවෙන් ප්‍රදේශ 21 කින් සමන්විත විය. මහනුවරට ආසන්නව පිහිටි උඩු නුවර, යටි නුවර, තුම්පනේ, හාරිස්පත්තුව, දුම්බර, හේවාහැට, කොත්මලේ, උඩ බුලත්ගම, පාත බුලත්ගම, රට වශයෙන් හැඳින්වූ ප්‍රදේශ විය. හතර කෝරළය, හත් කෝරළය, ඌව, සබරගමුව, මාතලේ, වලපනේ ආදි වශයෙන් හැඳින්වූ දිසාවනි 12 ක් තිබුණි. රට වශයෙන් හැඳින් වූ ප්‍රදේශ භාර නිලධාරීන් රටේ රාල හෙවත් රටේ මහත්වරු ලෙස හැඳින් වූ අතර ඔවුන් යටතේ ලියන රාල, උණ්ඩිය රාල හා තවත් සුළු නිලධාරීන් පිරිසක් සිට ඇත. දිසාවනි භාරව සිටි නිලධාරීන් දිසාව ලෙස හැඳින් වූ අතර දිසාවනිය කෝරළවලටත්, කෝරල පත්තුවලටත් බෙදා තිබුණි. කෝරළයක් භාරව සිටි නිලධාරියා කෝරළේ නමින් හැඳින්විණි. කෝරළයේ එක් එක් කුල භාරව මුහන්දිරම්වරුන් සිටි අතර, ඔවුන් යටතේ එක් එක් ගම් භාරව විදානේවරු සිටියහ.

### බද්දෙ සංවිධානය

දේශපාලන වශයෙන් පැවති ප්‍රාදේශීය සංවිධාන ජාලයට අමතරව දිසාව තුළ සිටි ශිල්පීන් හෝ කුලයන් ඔවුන්ගේ කාර්ය අනුව වෙන ම සංවිධානය කොට තිබුණි. මුල් කාලයේ බද්දෙ සංවිධානය වෙන ම ක්‍රියාත්මක වූවත් උඩරට රාජ්‍යයේ අවසාන කාලයේ එය දිසාව යටතේ ක්‍රියාත්මක විය. මෙම සංවිධාන ව්‍යුහයට උදාහරණ පහත දැක්වේ.

මඩිගෙ බද්ද (ප්‍රවාහන කටයුතු)

කුරුවෙ බද්ද(ඇතුන් ඇල්ලීම)

බඩහැල බද්ද(වළං තැනීම)

රදෘ බද්ද (රෙදි සේදීම)

හැඳ බද්ද (රෙදි විවීම)

### විහාර දේවාල පාලන කටයුතු

මේ යටතේ විහාරාරාම පාලන කටයුතු මහනායක හා අනුනායක හිමිවරුන්ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක විය. දළදා මාලිගාවේ කටයුතු දියවඩන නිලමෙතුමා මඟින් ක්‍රියාත්මක කෙරිණි. විහාර හා දේවාල නඩත්තුව පුද පූජා සංවිධානයට හා පෙරහැර කටයුතුවලට ගම්වර ලැබූ රාජකාරි ශ්‍රමය සැපයූ පිරිස් සිටියහ.

### අධිකරණ කටයුතු

- ඉහළම අධිකරණ බලතල රජු සතු විය.
- සෑම නිලධාරියෙකුට ම තම පදවිය අනුව අධිකරණ බලතල හිමි විය.
- ඇතැම් නඩු ඇසීමේ බලය වූයේ රජුට පමණි.

**රජතුමා විසින් ම විසඳන ලද නඩු වර්ග කිහිපයකි.**

| | |
|---|---|
| වැදගත් නායකයන් සම්බන්ධ නඩු | රාජද්‍රෝහිත්වය පිළිබඳ නඩු |
| කැරලි කෝලාහල පිළිබඳ නඩු | විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු |
| කුමන්ත්‍රණ නඩු | |

**එකල වැරදිකරුවන්ට ලබා දුන් දඬුවම් මෙසේ දැක්විය හැක.**

| | | |
|---|---|---|
| අතුල් පහර දීම | කස පහර දීම | රොඩී රැහැට දැමීම |
| දඩ ගැසීම | ඉපලෙන් තැලීම | හිසකෙස් කැපීම |
| දඬු කඳේ ගැසීම | දඟ ගෙයි ලෑම | දියේ ගිල්වා මැරීම |
| ඇතුන් ලවා පාගා මැරීම | පිටුවහල් කිරීම | |



ඡායාරූපය අංක 8.3 මහනුවර යුගයේ පැවති පැදුරු විවීමේ කර්මාන්තය ඉදිරියට ගෙන ගිය දහනමවන සියවස අයත් ශිල්පීන් පවුලක්

### 8.3 ආර්ථික ක්‍රමය

**මහනුවර රාජධානි සමයෙහි වූයේ කෘෂිකාර්මික අර්ථ ක්‍රමයකි.**

- එය පරිභෝජනය පදනම් කරගත් එකකි.
- ආර්ථික රටාව ස්වයංපෝෂිත එකක් විය.
- කඳුකර ප්‍රදේශ බහුල වූ බැවින් වී ගොවිතැන කළ හැකි ප්‍රදේශ සීමිත විය.
- පැරණි රජ රට හා රුහුණ යන ප්‍රදේශයන්ට අයත් පරිපාලන කොටස් උඩරටට අයත් වුව ද වාරිමාර්ග ක්‍රම පරිහානියට පත්ව තිබූ නිසා ගොවිතැන සීමිත විය.
- කඳුකර ප්‍රදේශයන්හි කඳු බෑවුම් ඔස්සේ සකස් කෙරුණු හෙල්වල, කුඹුරුවල වී ගොවිතැන සිදු කෙරුණි.
- උඩරට රාජ්‍යයේ වැඩි ඉඩම් ප්‍රමාණයක් හේන් ගොවිතැනට යෙදුණි.
- කුරක්කන්, අමු, මෙනේරි, ඉරිඟු වැනි ධාන්‍ය වර්ග හා අල බතල ඒවායේ වගා කෙරිණ.
- ගෙවතු ආශ්‍රිතව කොස්, දෙල්, ගම්මිරිස්, සාදික්කා, කරදමුංගු, පුවක්, එළවළු, පළතුරු වගා කරන ලදී.
- අතිරේක ආහාර බෝගයන් මගින් ද ආහාර අවශ්‍යතා සපුරා ගන්නා ලදී.
- යකඩ, දැව, ලෝහ හා ලාක්ෂා කර්මාන්තය ද පන් කර්මාන්තය ද දියුණුව පැවතිණ.
- කෘෂිකාර්මික කටයුතු සඳහාත් කිරි ලබා ගැනීම සඳහාත් සත්ත්ව පාලනය සිදු කරන ලදී.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පන්සල ගැමි දිවිය හා බැඳුණු මධ්‍යස්ථාන විය.

### 8.4 සමාජ සංවිධානය

- රටේ සියලු ඉඩම්වල උරුමකරුවා රජු බවට පිළිගැනීමක් විය.

- මහනුවර රාජධානියේ ඉඩම්, අයිතිය හා බුක්තිය පදනම් කරගෙන කොටස් කීපයකට බෙදුණි.

  **ගබඩාගම** රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම්

  **නින්දගම්** රදල ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම්

  **විහාරගම්** විහාරාරාම සාදා පූජා කළ ඉඩම්

  **දේවාලගම** දේවාල සඳහා පූජා කළ ඉඩම්

  **පරවේනිගම** (නින්දගම) ගම් වැසියන් පරම්පරාගතව බුක්ති විඳි ඉඩම්

රටවැසියෝ තමන් බුක්ති විඳි ඉඩම වෙනුවෙන් කිසියම් සේවාවක් හෝ නියමිත භාණ්ඩ ප්‍රමාණයක් රජුට සැපයූහ.

රට වැසියන්ගේ සේවා ක්‍රමය රාජකාරිය නමින් හැඳින්වීය.

- මහනුවර රාජධානියේ පැවතියේ ග්‍රාමීය සමාජයකි.

  ගම ස්වයංපෝෂිත එකක් විය.

  එහි සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත පදනම් විය.

  ඒ ඒ කුලයට වෙන් වූ ආර්ථික කටයුතු දක්නට විය.

  අවාහ විවාහ කටයුතු කුලය පදනම් කරගෙන සිදු කෙරිණ.

  දීග විවාහය, බින්න විවාහය හා එක ගෙයි කෑම යනුවෙන් විවාහ ක්‍රම තුනකි.

  උඩරට ගැමි සමාජයේ සියලු කටයුතු අත්තම් ක්‍රමයට සිදු විය.

  පවුල ප්‍රධාන සමාජ ඒකකය විය.

  ගුණගරුක බව සමාජයේ ප්‍රකට ලක්ෂණය විය.

**මහනුවර යුගයේ පාලකයෝ**

| | |
|---|---|
| *සේනාම්මත වික්‍රමබාහු රජු* | *(ක්‍රි.ව. 14691511)* |
| *ජයවීර බණ්ඩාර රජු* | *(ක්‍රි.ව. 15111551)* |
| *කරල්ලියද්දේ බණ්ඩාර රජු* | *(ක්‍රි.ව. 15511581)* |
| *පළමුවන රාජසිංහ රජු* | *(ක්‍රි.ව. 15811591)* |
| *පළමුවන විමලධර්මසූරිය රජු* | *(ක්‍රි.ව. 15921604)* |
| *සෙනරත් රජු* | *(ක්‍රි.ව. 16041635)* |
| *දෙවන රාජසිංහ රජු* | *(ක්‍රි.ව. 16351687)* |
| *දෙවන විමලධර්මසූරිය රජු* | *(ක්‍රි.ව. 16871707)* |
| *ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු* | *(ක්‍රි.ව. 17071739)* |
| *ශ්‍රී විජය රාජසිංහ රජු* | *(ක්‍රි.ව. 17391747)* |
| *කීර්ති ශ්‍රී රාජසිංහ රජු* | *(ක්‍රි.ව. 17471781)* |
| *රාජාධිරාජසිංහ රජු* | *(ක්‍රි.ව. 17811798)* |
| *ශ්‍රී වික්‍රම රාජසිංහ රජු* | *(ක්‍රි.ව. 17981815)* |

**ක්‍රියාකාරකම**

1. මහනුවර රාජධානියේ පාලකයන් ශ්‍රේෂ්ඨ වූ ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
2. මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය සමාජ ආර්ථික කාර්යක්ෂමතාවයට දායක වූ අකාරය පෙන්වන්න.
3. මහනුවර යුගයේ සමාජ සංවිධානය පිළිබඳ පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

**වැදගත් කරුණු**

1. මහනුවර යුගය ශ්‍රී ලංකාවේ අවසන් රාජධානි සමය යි. ඒ කාලය තුළ පාලකයින්ට පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන තෙවදෑරුම් යුරෝපීය ජාතීන් සමග කටයුතු කරන්නට සිදු විය.

2. මේ කාලය තුළ අපේ රජවරු රටේ එක්සත්භාවය රැකගැනීමට මහත් වෙහෙසක් දරමින් උපායශීලී ලෙස කටයුතු කළහ.

3. එකල සමාජය විවිධ වෘත්තීය කණ්ඩායම් අනුව සංවිධානය වී තිබිණි.

4. මහනුවර රාජධානිය පාලනය කළ ඇතැම් රජවරු නායක්කර් නමින් හැඳින්වෙන දකුණු ඉන්දියානු වංශයකට අයත් විය.

5. 1815 වර්ෂයේ දී එවක ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ රොබර්ට් බ්‍රවුන්රිග් ඇතුළු ඉංග්‍රිසි ජාතික නිලධාරීන් සහ උඩරට සිංහල ප්‍රභූවරුන් කිහිප දෙනෙකු අතර අත්සන් කරන ලද උඩරට ගිවිසුම නමින් හැඳින්වෙන ලේඛනය මගින් උඩරට රාජධානිය එංගලන්තයේ රජු වෙත පවරා දෙන ලදී. එය මහනුවර රාජධානියේ අවසානය ළඟා කරවීමට තුඩු දුන් ප්‍රධාන හේතුව ලෙස පෙනේ.